(3) upakāra (4) samānasukhadukkha

22. Select the option with pair of correct statements according to the prescribed portion of the Mahāvaṃsa.
A. The second son of king Muṭasīva is named Devānampiyatissa.
B. Minister Mahā-ariṭṭha is the uncle of king Devānampiyatissa.
C. King Dhammāsoka offered minister Ariṭṭha with a post of commander.
D. King Devānampiyatissa was coronated for the second time on a full moon day of June.
(1) A and C (2) A and D (3) B and C (4) B and D

23. Select the option with verbs belonging to **Past Indicative**, **Imperative** and **Optative** in order.
(1) pāhesi, ādāya, dhāveyya (2) jānāmi, uṭṭhāya, dadeyyuṃ
(3) agacchi, vadantu, bhaje (4) ovadi, bhavatu, pasādāya

24. Select the correct disjoined form of '**ratanānīdisānettha**'.
(1) ratanāni + īdisāni + ettha (2) ratanāni + edisāni + ettha
(3) ratanā + na + īdisāni + ettha (4) ratanā + edisā + na + ettha

25. What is the correct meaning of "**mā cintayi mahārāja**"?
(1) 'O great king, I thought of this.' (2) 'O great king, do not think of me.'
(3) 'O great king, you ought not to think.' (4) 'O great king, do not avoid thinking of this.'

26. Select the option only with indeclinable particles.
(1) evaṃ, have, yathā (2) iva, sabbattha, yesaṃ
(3) sadā, sammā, tumhe (4) yadā, sace, loke

27. **"Devo na sammā vassissati"** means
(1) the god will not live comfortably.
(2) the god causes not to rain well.
(3) the gods do not live comfortably in rainy season.
(4) rain does not fall well.

28. What is the correct statement regarding the word '**catasā**'?
(1) Instrumental singular of nominal base ceta.
(2) Ablative plural of nominal base ceta.
(3) Dative singular of nominal base cetas.
(4) Nominative plural of nominal base cetas.

29. Select the option with the statement that is **irrelevant** to describe '**viparivattanakāle**' according to the Mahāsupina-jātaka.
(1) akāraṇassa kāraṇanti gahaṇakāle. (2) kāraṇassa akāraṇanti chaḍḍanakāle.
(3) abhūtassa bhūtanti gahaṇakāle. (4) lajjīnaṃ ussannakāle.

30. What is the correct statement in relation to queen Mallikā?
(1) She is a woman who offered the Buddha with a mela ornament.
(2) She did not do any wrong in her life.
(3) She is a woman with wisdom of life even praised by the Buddha.
(4) She is the queen of king Bimbisāra.

31. '**Aggabrāhmaṇe**' is
(1) an Euphonic combination. (2) a Compound noun.
(3) a Secondary derivative. (4) a Primary derivative.

32. Select the relevant word to fill the blank in "**kaṇhaṃ dhammaṃ vippahāya, ... bhāvetha paṇḍito**".
(1) asataṃ (2) cittaṃ (3) dhammaṃ (4) sukkaṃ

33. Select the option with a dream that does **not** belong to the sixteen great dreams.
(1) Sight of ministers with gold filled pots at the door steps of the palace of king.
(2) Sight of floating a huge rock like catafalque as a ship.
(3) Sight of a horse with mouths at either end eating grass with both.
(4) Sight of sale of a hundred thousand worth pith of sandal wood for the price of rotten tuna fish.

34. What is the Pali word that denotes carpenter?
(1) usukārā (2) tacchakā (3) tasāvakā (4) nettikā

35. Select the **incorrect** statement regarding the Apadānapāḷi.
(1) It is a Canonical text with biographies.
(2) It is the eleventh text of the Khuddakanikāya.
(3) It has two parts as Therāpadāna and Therī-apadāna.
(4) It also incorporates Buddhāpadāna and Pacceka-Buddhāpadāna.

36. Which of the following Abhidhamma texts analyzes the cause and effect relationship most?
(1) The Dhammasaṃgaṇippakaraṇa (2) The Vibhaṃgappakaraṇa
(3) The Puggalapaññattippakaraṇa (4) The Paṭṭhānappakaraṇa

37. A disciplinary act to be purified from breaching a Vinaya promulgation of **formal meeting** is
(1) Abbhāna. (2) Parivāsa. (3) Mānatta. (4) Mūlāyapaṭikassana.

38. Who is the author of the Mahābodhivaṃsa?
(1) Ven. Vilgammula (2) Ven. Upatissa
(3) Ven. Vācissara (4) Ven. Vedeha

39. Select the option with antonyms.
(1) ākāsaṃ - okāsaṃ (2) ākulaṃ - samākulaṃ
(3) okaṃ - anokaṃ (4) gāraṃ - agāraṃ

40. The term '**nivāraye**' in "**asabbhā ca nivāraye**" is of
(1) Present tense, second person, singular.
(2) Imperative, first person, plural.
(3) Optative, third person, singular.
(4) Past conditional, second person, singular.

41. Select the option with appropriate pair of verse lines.

A - paṇḍito sīlasampanno
B - nivātavutti atthaddho
C - bhogā sannicayaṃ yanti
D - bhamarasseva irīyato
E - tādiso labhate yasaṃ
F - jalaṃ aggīva bhāsati

(1) A and D (2) B and E (3) B and F (4) C and E

42. Because of which of the following reasons that learning well by a student is a way of higher respect towards the teacher?
(1) It strengthens teacher-pupil relationship.
(2) The duty is fulfilled by the student.
(3) The student becomes virtuous.
(4) The student respects the teacher.

43. The period of time of the third Buddhist Council is
(1) three months. (2) four months.
(3) seven months. (4) nine months.

44. Which is the option with Three higher knowledges in order?
(1) pubbenivāsānussati, cutūpapāta, āsavakkhaya
(2) iddhividha, dibbasota, paracittavijānana
(3) sutamayapaññā, cintāmayapaññā, bhāvanāmayapaññā
(4) ñātapariññā, tīraṇapariññā, pahānapariññā

45. Select the option **without** a main characteristic of a Pali chronicle.
(1) Being connected to an item or event related to the biography of the Buddha.
(2) Bring out an unbroken tradition of events of historical significance.
(3) Showing only the services for the dispensation by kings.
(4) Generating the tastes of dhamma, meaning and serene pleasantness.

46. What are '**timaṇḍala**' of "**timaṇḍalaṃ paṭicchādentena...**"?
(1) Naval, calf and ankle (2) Naval and knees
(3) Shoulders and naval (4) Chest, naval and calf

47. Select the Pali word used for pillow.
(1) mañcapaṭipādakaṃ (2) bhummattharaṇaṃ
(3) paccattharaṇaṃ (4) bimbohanaṃ

48. A main fact that is conducive to maintain healthy social relationships is
(1) acting giving priority to religious relationships.
(2) performing the activities of others by oneself.
(3) respecting only those who are worthwhile to be done so.
(4) being abide by duties and responsibilities knowing one's own role.

49. Select the grammatically correct sentence.
(1) Mama aṭṭhannaṃ bhātarānaṃ catuttho dukkhaṃ vasati.
(2) Ayaṃ pañcadārakā abhiṇhaṃ magge kīḷanti.
(3) Bhagavā paṭhamaṃ vasse Bārāṇasiyaṃ Isipatane vihari.
(4) Tasmiṃ vane bahavo uccā rukkhā hoti.

50. Which is the option with the most suitable meaning for "**Ekaṃ māretvā ekassa sotthikammassa karaṇaṃ nāma natthi**"?
(1) After one died, it is useless to help another.
(2) One dying, it is useless being beneficial for another.
(3) There is nothing called performing the beneficial for one by killing another.
(4) There is no reason to kill one for a life of another.

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை- 2021(2022)

විෂය අංකය
பாட இலக்கம் 74 பාடம் විෂයය

පාලි

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

I පත්‍රය/பத்திரம் I

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.
01.	3	11.	4	21.	1	31.	2	41.	2
02.	2	12.	1	22.	1	32.	4	42.	2
03.	3	13.	1	23.	3	33.	1	43.	4
04.	4	14.	3	24.	1	34.	2	44.	1
05.	1	15.	1	25.	3	35.	2	45.	3
06.	2	16.	3	26.	1	36.	4	46.	2
07.	1	17.	1	27.	4	37.	1	47.	4
08.	2	18.	4	28.	1	38.	2	48.	4
09.	4	19.	2	29.	4	39.	3	49.	1
10.	2	20.	3	30.	3	40.	3	50.	3

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

පාලි / பாளி / Pali	II	74 STE II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න තංචිකානය කර ගැනීමටත් යොදාගන්න.

வினாத்தாளை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.

Use additional reading time to go through the question paper, select the questions you will answer and decide which of them you will prioritise.

උපදෙස්:

* I කොටසේ සියලු ම ප්‍රශ්නවලට ද, II හා III කොටස්වලින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සම්පූර්ණයෙන් එක් භාෂාවකින් පමණක් සැපයිය යුතු ය.

I කොටස

1. සිංහලට නගන්න.

(i) කථඤ්ච ගහපතිපුත්ත අරියසාවකො ඡද්දිසාපටිච්ඡාදී හොති? ඡයිමා ගහපතිපුත්ත දිසා වෙදිතබ්බා. පුරත්ථිමා දිසා මාතාපිතරෝ වෙදිතබ්බා. දක්ඛිණා දිසා ආචරියා වෙදිතබ්බා. පච්ඡිමා දිසා පුත්තදාරා වෙදිතබ්බා. උත්තරා දිසා මිත්තාමච්චා වෙදිතබ්බා. හෙට්ඨිමා දිසා දාසකම්මකරා වෙදිතබ්බා. උපරිමා දිසා සමණබ්‍රාහ්මණා වෙදිතබ්බා. පඤ්චහි බො ගහපතිපුත්ත ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා මාතාපිතරෝ පච්චුපට්ඨාතබ්බා. හතෝ නෙ සම්භරිස්සාම්, කිච්චං නෙසං කරිස්සාම්, කුලවංසං ඨපෙස්සාමි, දායජ්ජං පටිපච්ඡාම්, අථ වා පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුප්පදස්සාමී'ති. ඉමෙහි බො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා මාතාපිතරෝ පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි පුත්තං අනුකම්පන්ති. පාපා නිවාරෙන්ති, කල්‍යාණෙ නිවෙසෙන්ති, සිප්පං සික්ඛාපෙන්ති, පතිරූපෙන දාරෙන සංයොජෙන්ති, සමයෙ දායජ්ජං නියාතෙන්ති. ඉමෙහි බො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා මාතාපිතරෝ පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි පුත්තං අනුකම්පන්ති. එවමස්ස එසා පුරත්ථිමා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

(දීඝනිකාය)

ආදර්ශ පිළිතුරු

(i)

ගෘහපති පුත්‍රය, කෙසේ නම් ආර්ය ශ්‍රාවකයා සදිසා වසන්නේ වේද? ගෘහපතිපුත්‍රය, මේ සදිසා දත යුතුය. මව්පියෝ නැගෙනහිර දිශාව යැයි දත යුත්තාහ. ආචාර්යවරු දකුණු දිශාව යැයි දත යුත්තාහ. අඹුදරුවෝ බටහිර දිශාව යැයි දත යුත්තාහ. මිත්‍රාමාත්‍යයෝ (යහළුමිත්‍රයෝ) උතුරු දිශාව යැයි දත යුත්තාහ. දැසිදස් කම්කරුවෝ යට දිශාව යැයි දත යුත්තාහ. මහණ බමුණෝ උඩ දිශාව යැයි දත යුත්තාහ. ගෘහපති පුත්‍රය, කරුණු පසකින් පුත්‍රයා විසින් නැගෙනහිර දිශාව වූ මව්පියෝ උපස්ථාන යුත්තාහ. (ඔවුන් විසින්) පෝෂණය කරන ලද මම ඒ මවුපියන් පෝෂණය කරන්නෙමි. ඔවුන්ගේ කටයුතු කරන්නෙමි. කුල පරපුර පිහිටුවන්නෙමි. දායාදය පිළිපදින්නෙමි.

තව ද කලුරිය කොට මේ භවයෙන් ඉවත්ව ගියවුන්ට (මව්පියන්ට) දන් දී පින් දෙන්නෙමි යනුවෙනි. ගෘහපතිපුත්‍රය, මේ කරුණු පසින් පුත්‍රයා විසින් උපස්ථාන කරන ලද්දාවූ නැගෙනහිර දිශාව වූ මව්පියෝ කරුණු පසකින් පුත්‍රයාට අනුකම්පා කරති. පාපයෙන් වළක්වති. යහපතෙහි යොදවති. ශිල්ප හදාරවති. සුදුසු වූ භාර්යාවක සමඟ යොදවති. සුදුසු කාලයෙහි දායාදය පවරා දෙති. ගෘහපතිපුත්‍රය, මේ කරුණු පහෙන් පුත්‍රයා විසින් උපස්ථාන කරන ලද නැගෙනහිර දිශාව වූ මව්පියෝ මේ කරුණු පහෙන් පුත්‍රයාට අනුකම්පා කරති. මෙසේ ඔහු විසින් මේ නැගෙනහිර දිසාව උවදුරු රහිත කොට ප්‍රතිභය රහිත කොට වසන ලද්දේ වෙයි.

(ii) "අහං බුද්ධඤ්ච ධම්මඤ්ච - සංඝඤ්ච සරණංගතො,
උපාසකත්තං දෙසෙසිං - සක්‍යපුත්තස්ස සාසනෙ;

තිවිමපි මානි රතනානි - උත්තමානි නරුත්තම,
චිත්තම්පසාදයිත්වාන - සද්ධාය සරණං වජ."

"කරොථ මේ සහායස්ස - අභිසෙකං පුනොති"ඉති,
වත්වා සහායාමච්චෙ තෙ - සක්කරිත්වා ච පෙසයී.

පඤ්ච මාසෙ වසිත්වාන - තෙ මච්චා තීවසක්කතා,
වෙසාඛසුක්කපක්ඛාදි - දිනෙ දූතා විනිග්ගතා.

තාම්ලිත්තියමාරුය්හ - නාවං තෙ ජම්බුකොලකෙ,
ඔරුය්හ භූපං පස්සිංසු - පත්වා ද්වාදසියං ඉධ.

(මහාවංස)

(ii)

මම බුදුන් ද දහම් ද සඟුන් ද සරණ ගියෙමි. ශාක්‍ය පුත්‍රයන් වහන්සේගේ ශාසනයෙහි උපාසක බව ප්‍රකාශ කළෙමි.

රජතුමනි, ඔබ ද සිත පහදවාගෙන මේ උතුම් රත්නයන් ශ්‍රද්ධාවෙන් සරණ යනු මැනවි.

නැවත මාගේ මිත්‍රයාගේ අභිෂේකය කරවු යැයි පවසා ඒ යහළු ඇමතිවරුන්ට සත්කාර ද කොට යැවීය.

ඒ ඇමතිදූතයෝ අතිශයින් සත්කාර කරන ලද්දාහු මාස පහක් වාසය කොට වෙසක් මස පුර පැළවිය දා (ශුක්ල පක්ෂයෙහි ප්‍රථම දිනයේ) පිටත් වූහ.

ඔවුහු තාම්‍රලිප්තියේ දී නැවට නැගී දඹකොළ පටුනෙහි බැස දොළොස්වක දා (දොළොස් වන දිනයේ) මෙහි පැමිණ රජු බැහැ දුටහ.

ලකුණු දීමේ ක්‍රමය

(i) **කොටසට** හිමි **ලකුණු සංඛ්‍යාව 10කි.** එහි පාඨය සිංහලට නැගීමේදී නිවැරදි අවබෝධය සඳහා ලකුණු **අටක්** ද ව්‍යාකරණානුකූල භාෂා භාවිතය සඳහා ලකුණු **දෙකක්** ද වශයෙන් සලකා ලකුණු පිරිනමන්න. දුෂ්කර පද අතහරිමින් මනඃකල්පිතව කෙරෙන පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

(ii) **කොටසට** හිමි **ලකුණු සංඛ්‍යාව ද 10කි.** එහි නිවැරදි එක් ගාථා පරිවර්තනයකට ලකුණු **02** බැගින් සලකා ලකුණු දීම සුදුසු ය. නිවැරදි අවබෝධය ප්‍රකාශ නොවන, දුෂ්කරපද මගහැර ඇති, ව්‍යාකරණානුකූල හා අන්වයානුකූල නොවන පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

(ලකුණු 10 + 10 = 20)

2. (i) **සිංහලට** නගන්න.

සචෙ සද්ධිවිහාරිකො ගිලානො හොති කාලස්සෙව උට්ඨාය දන්තකට්ඨං දාතබ්බං, මුඛොදකං දාතබ්බං, ආසනං පඤ්ඤාපෙතබ්බං. සචෙ යාගු හොති භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා. යාගුං පීතස්ස උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධොවිත්වා පටිසාමෙතබ්බං. සද්ධිවිහාරිකම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ සද්ධිවිහාරිකො ගාමං පවිසිතුකාමො හොති නිවාසනං දාතබ්බං. පටිනිවාසනං පටිග්ගහෙතබ්බං. කායබන්ධනං දාතබ්බං. සඝණං කත්වා සංඝාටියො දාතබ්බා. ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බො.

(චුල්ලවග්ගපාළි)

(ii) **පාලියට** නගන්න.

(අ) ළමයා යහළුවාගේ බල්ලා ගෙන එයි.
(ආ) මම මාර්ගයෙහි දිවියකු දුටුවෙමි.
(ඉ) අපගේ පුත්‍රයෝ ඍෂිවරයාගෙන් උගනිති.
(ඊ) අපි ආගන්තුකයාගෙන් මුවකු මිළට ගත්තෙමු.
(උ) ධනවතුන්ගේ පුත්‍රයෝ සැමදා ප්‍රඥාවන්තු නොවෙති.

(ලකුණු 10 + 10 = 20)

ආදර්ශ පිළිතුරු

(i)

ඉදින් සද්ධිවිහාරිකයා ගිලන් වූයේ වේ නම් කල් ඇතිව ම නැගිට දැහැටි දිය යුතු ය. මුව සෝදීමට ජලය දිය යුතුය. අසුන් පැනවිය යුතුය. ඉදින් කැඳ ඇත්නම් භාජනය සෝදා කැඳ ගෙනවිත් දිය යුතුය. කැඳ පානය කළ තැනැත්තාට පැන් දී බඳුන පිළිගෙන පහත් කොට කිසිවක නොගටමින් මැනවින් සෝදා තැන්පත් කළ යුතුය. සද්ධිවිහාරිකයා නැගිසිටි කල්හි ආසනය ඉවත් කළ යුතුය. ඉදින් ඒ තැන කුණු කසල ඇත්නම් එතැන හැමදිය යුතුය. ඉදින් සද්ධිවිහාරිකයා ගමට පිවිසීමට කැමති වෙයි නම් අඳනය දිය යුතුය. හැඳසිටි අඳනය (පටිනිවාසනය) පිළිගත යුතුය. බඳ පටිය දිය යුතුය. සඟුණ කොට සඟළ සිවුර දිය යුතුය. පාත්‍රය සෝදා ජලය සහිතව දිය යුතුය.

(ii)

(අ) බාලකො සහායකස්ස/මිත්තස්ස සුනඛං ආහරති.
(ආ) අහං මග්ගෙ දීපිං පස්සිං/අපස්සිං.
(ඉ) අම්හාකං පුත්තා ඉසිම්හා/ඉසිනා උග්ගණ්හන්ති.
(ඊ) මයං අතිථීම්හා මිගං කිණිස්සාම.
(උ) ධනවතං/ධනවන්තානං පුත්තා සදා පඤ්ඤාවන්තා න භවන්ති/හොන්ති.

ලකුණු දීමේ ක්‍රමය

(i) කොටසට හිමි **ලකුණු සංඛ්‍යාව 10කි.** එහි පාඨය සිංහලට නැගීමේදී නිවැරදි අවබෝධය සඳහා ලකුණු **අටක්** ද ව්‍යාකරණානුකූල භාෂා භාවිතය සඳහා ලකුණු **දෙකක්** ද වශයෙන් සලකා ලකුණු පිරිනමන්න. දුෂ්කර පද අතහරිමින් මනඃකල්පිතව කෙරෙන පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

(ii) කොටසට ද හිමි **ලකුණු සංඛ්‍යාව 10කි.** එහි නිවැරදි එක් වාක්‍යයකට ලකුණු **දෙක** බැගින් පිරිනමන්න. එක් දෝෂයක් පමණක් ඇති වාක්‍යවලට **ලකුණු එකහමාරක්** ද වැරදි දෙකක් ඇති වාක්‍යවලට **එක් ලකුණක්** ද බැගින් ලකුණු පිරිනමන්න. වැරදි දෙකකට වඩා ඇත්නම් ලකුණු හිමි නො වේ. සමාන වචන යොදා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 10 + 10 = 20)

II කොටස

3. (i) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කිං පන තෙ මහාරාජ ... සදෙවකෙ ලොකෙ අග්ගපුග්ගලං සබ්බඤ්ඤුං විසුද්ධං නික්කිලෙසං මහාබ්‍රාහ්මණං න ජානාසි? සො හි භගවා සුපිනන්තරං ජානෙය්‍ය, ඉච්ඡ තං පුච්ඡ මහාරාජා'ති. සාධු දෙවී'ති රාජා විහාරං ගන්ත්වා සත්ථාරං වන්දිත්වා නිසීදි. සත්ථා මධුරස්සරං නිච්ඡාරෙත්වා කින්නුඛො මහාරාජ අනිප්පගෙව ආගතොසි'ති ආහ. අහං භන්තෙ පච්චූසසමයෙ සොළසමහාසුපිනෙ දිස්වා භීතො බ්‍රාහ්මණානං ආරොචෙසිං. බ්‍රාහ්මණා තක්ඛලා මහාරාජ සුපිනා, එතෙසං පටිඝාතනත්ථාය සබ්බචතුක්කෙන යඤ්ඤං යජිස්සාමා'ති යඤ්ඤං සජ්ජෙන්ති. බහූ පාණා මරණභයතජ්ජිතා, තුම්හෙව සදෙවකෙ ලොකෙ අග්ගපුග්ගලො, අසීතානාගතපච්චුප්පන්නං උපාදාය නත්ථි සො සෙය්‍යධම්මො යො වො ඝදාණමුඛෙ ආපාථං නාගච්ඡති. එතෙසං මෙ සුපිනානං නිප්ඵත්තිං කථෙථ භගවා'ති.

(අ) ඉහත පාඨයෙහි 'මහාබ්‍රාහ්මණ' යන්නෙන් අදහස් වන්නේ කවරෙක් ද?
(ආ) මල්ලිකා දේවිය කොසොල් රජුට දුන් උපදේශය, පාඨයෙහි සඳහන් අයුරින් සිංහලෙන් ලියා දක්වන්න.
(ඉ) ඝදාණමුඛ, සෙය්‍යධම්ම හා සබ්බචතුක්ක යන පදවලින් අදහස් වන්නේ කුමක්දැයි දක්වන්න.
(ඊ) විපත්වලින් බේරීමට යාගය පිළියමක් නොවන බව බෞද්ධ ඉගැන්වීම් අනුව පැහැදිලි කරන්න.

(i) ආදර්ශ පිළිතුරු

(අ) බුදුරජාණන් වහන්සේ

(ආ) මහරජතුමනි, දෙවියන් සහිත ලෝකයෙහි අග්‍ර පුද්ගලයා වූ සර්වඥ වූ පවිත්‍ර වූ නික්ලේශී වූ මහාබ්‍රාහ්මණයා නොදන්නෙහි ද? ඒ භාග්‍යවතුන් වහන්සේ සිහිනයන්හි වෙනස දන්නා සේක. උන්වහන්සේ වෙත ගොස් විමසන්න.

(ඉ) **ඤාණමුඛ** යනු බුදුරජාණන් වහන්සේගේ සර්වඥතාඥානය නමැති මුඛයයි. **ඤෙය්‍යධම්ම** යනු අතීත, වර්තමාන හා අනාගත කාල ප්‍රතිබද්ධව දකයුතු සියලු ධර්මයන්ය. **සබ්බවතුක්ක** යනු යනු සර්වචතුෂ්ක යාගයයි. එනම් එක් සත්ත්ව කොට්ඨාසයකින් සතුන් හතර බැගින් ගෙන කරණු ලබන යාගයයි.

(ඊ) බමුණු ඉගැන්වීමට අනුව කළ පව් ශමනය කිරීමට, සුගතිගාමී වීමට හා ජීවිතයට අවශ්‍ය සෑම ආරක්ෂාවක් ම ලබා ගැනීමට යාගය හේතු වේ. බුදුසමය යාගය තමාටත් අනුන්ටත් හානි වන සාවද්‍ය ක්‍රියාවක් ලෙස දක්වා ඇත. මජ්ඣිමනිකායේ සන්දක සූත්‍රයෙහි යාගය අත්තන්තප හා පරන්තප යන උභය ලක්ෂණයෙන් යුතු හිංසක ක්‍රියාවක් බව දක්වා ඇත. සංයුත්තනිකායේ කොසොල් රජු සිදු කිරීමට සැලසුම් කළ යාගයක් ප්‍රතික්ෂේප කරමින්

''අස්සමෙධං පුරිසමෙධං සම්මාපාසං වාජපෙය්‍යං නිරග්ගලං,
මහායඤ්ඤා මහාරම්භා න තෙ හොන්ති මහප්ඵලා.'' යනුවෙන් දේශනා කර ඇත. යාගය වෙනුවට නිර්දිෂ්ට බෞද්ධ පිළිවෙත වන්නේ දානයයි.

(ii) නිර්දිෂ්ට ග්‍රන්ථාගත පහත එක් එක් වාක්‍යයේ හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

(අ) රාජා ..... පරිවාරෙන උය්‍යානං ගන්ත්වා තාපසං වන්දි.
(මහන්තො/ මහන්තං/ මහන්තෙන/ මහන්තස්ස)

(ආ) කතමස්ස ..... කම්මකිලෙසා පහීණා හොන්ති?
(චත්තාරො/ චත්තාරි/ චතූහි/ චතූසු)

(ඉ) ඉදං බො භික්ඛවෙ සද්ධිවිහාරිකානං උපජ්ඣායෙසු වත්තං, ...
සද්ධිවිහාරිකෙහි උපජ්ඣායෙසු වත්තිතබ්බං.
(ඉති/ යථා/ යදා/ කදා)

(ඊ) එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො .....
(පකාසෙසි/ පකාසයි/ පකාසෙසුං/ පකාසිතො)

(උ) යත්ථ වා තත්ර වා හොතු ..... තුය්හිමිනා ව්‍යාපාරෙන?
(කො/ කස්ස/ කිං/ කදා)

(ii)

(අ) රාජා **මහන්තෙන** පරිවාරෙන උය්‍යානං ගන්ත්වා තාපසං වන්දි.

(ආ) කතමස්ස **චත්තාරො** කම්මකිලෙසා පහීණා හොන්ති.

(ඉ) ඉදං බො භික්ඛවෙ සද්ධිවිහාරිකානං උපජ්ඣායෙසු වත්තං **යථා** සද්ධිවිහාරිකෙහි උපජ්ඣායෙසු වත්තිතබ්බං.

(ඊ) එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො **පකාසිතො.**

(උ) යත්ථ වා තත්ථ වා හොතු **කිං** තුය්හිමිනා ව්‍යාපාරෙන.

ලකුණු දීමේ ක්‍රමය

(i) කොටසට හිමි **ලකුණු සංඛ්‍යාව 10කි.** එහි ප්‍රශ්න හතරේ නිවැරදි පිළිතුරු සඳහා පිළිවෙළින් **ලකුණු 1 + 2 + 3 + 4** බැගින් හිමි වේ.

(ii) කොටසේ එක් නිවැරදි පිළිතුරකට **ලකුණු දෙක** බැගින් **ලකුණු 10 ක්** පිරිනමන්න.

(ලකුණු 10 + 10 = 20)

4. (i) පාලි භාෂාවේ නිජබිම පිළිබඳ විද්වත් මත **පහක්** හෙතිහැර දක්වන්න.

(ii) පහත වගුවෙහි **A** කොටසේ කරුණුවලට අදාළ වන සූත්‍ර **B** කොටසින් තෝරා ලියන්න.

A	B
(අ) අතීත බුදුවරුන් පිළිබඳ විස්තර ඇතුළත් ය.	අට්ඨකනාගරේ සූත්‍රය
(ආ) ධම්මාදාස යන අපර නාමයකින් හැඳින්වේ.	ධම්මචෙතිය සූත්‍රය
(ඉ) බුදුරදුන් හා කොසොල් රජු එක ම දේශයක උපත් බව කියැවේ.	ඛන්ධ සූත්‍රය
(ඊ) සර්ප වර්ගයන්ට මෛත්‍රී භිරීමේ ආනිශංස විස්තර වේ.	බහුධාතුක සූත්‍රය
(උ) ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන් විසින් දේශිත ය.	මහාපදාන සූත්‍රය

(iii) විනය පිටකයට අයත් ග්‍රන්ථ අතර මහාවග්ගපාළියේ සුවිශේෂතාව සකාරණව පෙන්වා දෙන්න.

(iv) පහත සඳහන් කරුණුවලට අදාළ පාලි ග්‍රන්ථ වරහන තුළින් තෝරා ලියන්න.

(ගන්ධවංස, පිනවංසදීප, ථූපවංස, සාසනවංසදීප, හත්ථවනගල්ලවිහාරවංස)

(අ) අමරපුර නිකාය පිහිටුවීමේ ඉතිහාසය විස්තර වේ.

(ආ) ග්‍රන්ථකාරක ආචාර්යවරුන්ගේ නම් ගම් සඳහන් ය.

(ඉ) බුද්ධචරිතය වර්ණනා කෙරෙන පාලි මහාකාව්‍යයකි.

(ඊ) වාචිස්සර නම් තෙර නමක විසින් රචිත කෘතියකි.

(උ) සිරිසඟබෝ රජු පිළිබඳ කථා ප්‍රවෘත්තිය ඇතුළත් ය.

(ලකුණු 5+5+5+5=20)

ආදර්ශ පිළිතුරු

(i)

- පාලි භාෂාව කෝසල රාජ්‍යයේ අන්‍යෝන්‍ය ගනුදෙනු සඳහා පැවති රාජ්‍ය භාෂාවකි - **රීස් ඩෙව්ඩිස් මහතා.**
- පාලිය අර්ධ මාගධියෙන් සකස් කර ගත් ශාස්ත්‍රීය භාෂාවක් බවත් එය මෙකල ඉංග්‍රීසි බස මෙන් දඹදිව නානා දේශවාසීන්ගේ අදහස් හුවමාරුව සඳහා භාවිත කළ බව - **විල්හෙල්ම් ගෙගෙර් මහතා**
- පාලිය පාටලීපුත්‍රයේ ව්‍යවහාරව පැවති භාෂාවයි - **ඊ. ජෙ. තෝමස් මහතා**
- පාලිය කළිඟු රටින් ලක්දිවට ගෙනෙන ලද භාෂාවකි - **ඔල්ඩර්න්බර්ග් මහතා**

- පාලිය බෞද්ධයන්ගේ සාහිත්‍ය භාෂාව බවත් භාෂා කීපයක් සම්මිශ්‍රණයෙන් එය සකස් වූ බව හා මාගධී භාෂාවට වැඩි සම්බන්ධයක් ඇති බව - **වින්ටර්නිට්ස් මහතා**
- මහින්ද තෙරුන් උජ්ජයිනියේ වැඩි කලක් විසූ නිසාත් ගිර්නාර් අශෝක සෙල්ලිපියට සමාන බසක් නිසාත් පාලිය උජ්ජයිනියෙන් ලක්දිවට ගෙනෙන ලද බසක් බව - **වැස්ටර්ගාඩ්** සහ **කුන්** පඬිවරු
- පාලිය අවන්ති රටෙහි පැවති පෙශාචී භාෂාවට සමාන බව - **නලිනාක්ෂ දත් මහතා**
- වින්ධ්‍ය පර්වත සමීපස්ථ ප්‍රදේශය පාලියේ නිජබිම බව - **ස්ටෑන්ක්නෝ**
- පාලිය ලක්දිව මහාවිහාරීය භික්ෂූන්ගේ නිෂ්පාදනයක් බව - **සී. එච්. ඉයෙඩ්. වික්‍රමසිංහ මහතා**

(ii)

A	B
(අ) අතීත බුදුවරුන් පිළිබඳ විස්තර ඇතුළත්ය.	මහාපදාන සූත්‍රය
(ආ) ධම්මාදාස යන අපරනාමයකින් හැඳින්වේ.	බහුධාතුක සූත්‍රය
(ඉ) බුදුරදුන් හා කොසොල් රජු එකම දේශයක උපන් බව කියැවේ.	ධම්මචෙතිය සූත්‍රය
(ඊ) සර්ප වර්ගයන්ට මෛත්‍රී කිරීමේ ආනිසංස විස්තර වේ.	ඛන්ධ සූත්‍රය
(උ) ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන් විසින් දේශිතය.	අට්ඨකනාගර සූත්‍රය

(iii)

- විනය පිටකයේ සිව්වැනි ග්‍රන්ථය වන මෙය බන්ධක දහයකින් පරිමිතය.
- බුද්ධ චරිතයේ බුද්ධත්වය ලැබූ තැන් පටන් සැරියුත් මුගලන් දෙනමට අගසව් තනතුරු දීම දක්වා පුවත් ඇතුළත් වේ.
- උපෝසථය, වස් එළඹීම, වස් පවාරණය ආදි ශාසනික චර්යාවන්හි ආරම්භය හා විකාශය විස්තර වේ.
- බෙහෙත් ගැනීම හා පසල් දනව්වලදී අනුගමනය කළ යුතු ශාසනික පිළිවෙත් විස්තර වේ.
- කඨින හා සිවුරු සැකසීම පිළිබඳව කරුණු ඇතුළත්ය.
- භික්ෂූන්ට දඬුවම් පැමිණවීම හා කෙසඹෑනුවර භික්ෂූන්ගේ භේදවීම ආදී කරුණු ඇතුළත්වීම නිසා බුද්ධ ශාසනයේ ආරම්භය හා විකාශය පිළිබඳව තොරතුරු ගවේෂණය කරන්නෙකුට ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙනුත් ශාසනික චර්යා ධර්ම පිළිබඳව මූලාශ්‍රයක් වශයෙනුත් මෙය වැදගත් වේ.

(iv)

(අ) සාසනවංසදීප

(ආ) ගන්ධවංස

(ඉ) ජිනවංසදීප

(ඊ) ථූපවංස

(උ) හත්ථවනගල්ලවිහාරවංස

ලකුණු දීමේ ක්‍රමය

i. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති කරුණුවලින් හෝ ඊට අදාළ වෙනත් කරුණුවලින් පහක් දක්වා තිබිය යුතු ය. එක් මතයක් දැක්වීමට **ලකුණු 1** බැගින් **ලකුණු 05** පිරිනමන්න.

ii. එක් නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් **ලකුණු 05ක්** හිමි වේ.

iii. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති කරුණුවලින් හෝ ඊට අදාළ වෙනත් කරුණුවලින් පහක්වත් විස්තර කොට තිබිය යුතු ය. එක් පැහැදිලි කිරීමකට **ලකුණු 1** බැගින් **ලකුණු 05** පිරිනමන්න. කරුණු නම් කිරීම පමණක් සිදුකොට ඇත්නම් ලකුණු භාගය බැගින් හිමි වේ.

iv. එක් නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් **ලකුණු 05ක්** හිමි වේ.

(ලකුණු 5 + 5 + 5 + 5= 20)

5. (i) නිර්දිෂ්ට ග්‍රන්ථවලින් නිදසුන් උපුටා දක්වමින් උපමා හා අනුප්‍රාස යන අලංකාර දෙක හඳුන්වන්න.

(ii) කීර්තිමත් පොරුෂයක් සහිත පුද්ගලයකු වීමට හේතු වන කරුණු **දහයක්** පහත ගාථා ඇසුරෙන් ගෙනහැර දක්වන්න.

උට්ඨානකෝ අනලසෝ - ආපදාසු න වෙධති,
අච්ඡින්නවුත්ති මෙධාවී - තාදිසෝ ලභතෙ යසං.

සඬ්ගාහකෝ මිත්තකරෝ - වදඤ්ඤූ විතමච්ඡරෝ,
නෙතා විනෙතා අනුනෙතා - තාදිසෝ ලභතෙ යසං.

(iii) චක්කලිත්ථෙරාපදානය ඇසුරෙන් චක්කලි තෙරුන්ගේ පෙර භවය පිළිබඳ කෙටි විවරණයක් කරන්න.

(iv) වම්පරම මිතුප්‍රතිරූපකයාගේ චරිත ලක්ෂණ පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් කරන්න.

(ලකුණු 5+5+5+5 =20)

ආදර්ශ පිළිතුරු

(i)

උපමා යනු වස්තුවක් තවත් වස්තුවකට සමාන කිරීමයි. පාලියෙහි අරුත් පැහැදිලි කිරීමට බෙහෙවින් භාවිත අලංකාරය උපමාවයි. උපමාව යෙදෙන විට **ඉව, විය, එව, යථා, සෙය්‍යථාපි** ආදි නිපාත පද යෙදී තිබෙනු දැකගත හැකිය. ධර්මාර්ථ විශ්ලේෂණයේ දී නිර්දිෂ්ට කොටස් තුළ උපමා යොදා ඇති පහත නිදසුන්වලින් ප්‍රකට වේ.

''නිධීනංව පවත්තාරං, යං පස්සෙ වජ්ජදස්සිනං''
''සෙලෝ යථා එකඝනෝ, වාතෙන න සමීරති,
''එවං නින්දා පසංසාසු, න සම්ඡ්ඣන්ති පණ්ඩිතා''
''පණ්ඩිතෝ සීල සම්පන්නෝ, ජලමග්ගීව භාසති''
''භොගෙ සංහරමානස්ස, භමරස්සෙව ඉරීයතෝ,
භොගා සන්නිචයං යන්ති, වම්මිකෝ වුපචියති'.'

අනුප්‍රාස යනු ශබ්දාලංකාරයකි. සමාන පද අක්ෂර ලංව යෙදීමෙන් උපදින ශබ්ද මාධුර්ය අනුප්‍රාස නම් වේ. අනුප්‍රාසාලංකාරය වඩාත් හොඳින් කැපී පෙනෙන නිදසුන් කීපයක් නිර්දිෂ්ට කෘති ඇසුරෙන් පහත දැක්වේ.

''වදනෙන සුගන්ධෙන මධුරෙන රුතෙන ච''

''රඤ්ජයං පරිසං සබ්බං සන්ථවී සාවකං සකං''

''උදකං හි නයන්ති නෙත්තිකා, උසුකාරා නමයන්ති තෙජනං,
දාරුං නමයන්ති තච්ඡකා, අත්තානං දමයන්ති පණ්ඩිතා.''

(ii)

i.	උට්ඨානකෝ	-	කටයුතු උත්සාහයෙන් කටයුතු කිරීම
ii.	අනලසෝ	-	කම්මැලි නොවී කටයුතු කිරීම
iii.	ආපදාසු න වෙධති	-	ආපදාවක් පැමිණි විට කම්පා නොවීම
iv.	අච්ඡින්නවුත්ති	-	නොකැලැල් ජීවන පැවැත්ම
v.	මෙධාවී	-	ස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කිරීම
vi.	සඞ්ගාහකෝ	-	සතර සංග්‍රහ වස්තුවෙන් සංග්‍රහ කරන්නෙකු වීම
vii.	මිත්තකරෝ	-	මිතුරන් උපදවන්නෙක් වීම
viii.	වදඤ්ඤූ	-	පමණ දැන කතා කරන්නෙකු වීම
ix.	වීතමච්ඡරෝ	-	මසුරු මල දුරු කොට දන්දීම
x.	නෙතා විනෙතා අනුනෙතා	-	ඇසුරු කරන්නවුන් යහපත පිණිස පමුණුවන, හික්මවන, නැවත නැවත පමුණුවන්නෙකු වීම.

(iii)

මෙයින් කල්ප ලක්ෂයකට පෙර පදුමුත්තර බුදුන් දවස වක්කලී තෙරුන් හංසවතී නුවර බමුණු පුතෙක්ව උපන්නේය. පිරිස් මැද බණ දේශනා කරන පදුමුත්තර බුදුරජාණන් වහන්සේ එක් භික්ෂුවක සැදැහැතියන්ට අග්‍ර කොට පමුණුවා වදාළහ. මේ කුල පුත්‍රයා එය දැක එබඳු තනතුරකට රුචි කළේය. පසුව එම පියුමතුරා බුදුන් ප්‍රමුඛ සංඝයාට මහ දන් පවත්වා තම අභිප්‍රාය බුදුන් ඉදිරියේ ප්‍රකාශ කළේය. පියුමතුරා බුදුහු ගෞතම බුදුන් දවස එම ප්‍රාර්ථනය සමෘද්ධ වන බවට නියත විවරණ දුන්හ. එම කුශලයේ බලයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සැප විඳිමින් පැමිණ අප බුදුන් සමයෙහි සැවැත්නුවර කුල පුත්‍රයෙක්ව උපන්නේය.

(iv)

i. අතීතෙන පටිසන්ථරති - අතීතයෙන් සංග්‍රහ කරමින් පිළිසඳරෙහි යෙදෙයි.

ii. අනාගතෙන පටිසන්ථරති - අනාගතයෙන් සංග්‍රහ කරමින් පිළිසඳරෙහි යෙදෙයි.

iii. නිරත්ථකෙන සංගණ්හාති - නිරර්ථක දෙයින් සංග්‍රහ කරයි.

iv. පච්චුප්පන්නෙසු කිච්චෙසු ව්‍යසනං දස්සෙති. - එළඹි කටයුතුවල ව්‍යසනය පෙන්වා දෙයි.

ලකුණු දීමේ ක්‍රමය

i. උපමාව පැහැදිලි කිරීමට **ලකුණු දෙක හමාරක්** ද, අනුප්‍රාසය පැහැදිලි කිරීමට **ලකුණු දෙක හමාරක්** ද, වශයෙන් **ලකුණු 05** බෙදාගන්න. උපමා හා අනුප්‍රාස නිර්වචනයට **එක් ලකුණ** බැගින් ද නිර්දිෂ්ට ග්‍රන්ථවලින් නිදසුන් අදාළ ලෙස යොදා ඇත්නම් එක් නිදසුනකට ලකුණු භාගය බැගින් ද පිරිනමන්න.

ii. නිවැරදි එක් පිළිතුරකට ලකුණු භාගය බැගින් **ලකුණු 05** හිමි වේ.

iii. ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති පරිදි ලියා ඇති පිළිතුරට **ලකුණු 05** පිරිනමන්න.

iv. හැඳින්වීමට එක් ලකුණක් ද ආදර්ශ පිළිතුරේ දී ඇති පරිදි එක් කරුණක් දැක්වීමට එක් ලකුණ බැගින් **ලකුණු 05** පිරිනමන්න.

(ලකුණු 5 + 5 + 5 + 5= 20)

III කොටස

6. (i) පහත දැක්වෙන ශබ්ද ප්‍රකෘතිවලට අදාළ විභක්ති රූප දක්වමින් වගුව සම්පූර්ණ කොට ලියා දක්වන්න.

	ශබ්ද ප්‍රකෘතිය	දුතියා බහුවචන	චතුත්ථී ඒකවචන
(අ)	භික්ඛු		
(ආ)	රත්ති		
(ඉ)	ඵල		
(ඊ)	අම්හ		
(උ)	දසම		

(ii) පහත දැක්වෙන පදවල ධාතු ප්‍රත්‍යය වෙන්කොට දක්වන්න.

(අ) සුත්වාන (උ) වක්ඛා
(ආ) කාතුං (ඵ) ප්ලවමානා
(ඉ) රජිතබ්බං (ඒ) පුච්ඡෝ
(ඊ) ඨිතො (ඔ) ඉච්ඡෙය්‍ය
(උ) භුඤ්ජන්තො (ඕ) හරිස්සං

(iii) පහත දැක්වෙන අර්ථ ප්‍රකාශ වන තද්ධිත පද පාලියෙන් ලියා දක්වන්න.

(අ) අලසකම (උ) නිවනට පමුණුවන
(ආ) කුලවත් පුද්ගලයා (ඵ) පසුව උපන් කැනැත්තා
(ඉ) දැහැමි කැනැත්තා (ඒ) මිනිසත් බව
(ඊ) දුප්පත්කම (ඔ) සයවැන්නා
(උ) නගරයෙහි වසන්නා (ඕ) සිවුවෙනි

(iv) පහත වරහන් තුළ දී ඇති උපසර්ග යොදා, වගුවෙහි දක්වා ඇති ධාතු හා අර්ථ ඇසුරෙන් සෑදෙන පාලි ආඛ්‍යාත පද ලියා දක්වන්න.
(ස, නී, උ, සං, වි, අව, අධි, පති, ආ, උප)

	ධාතුව	අර්ථය	ආඛ්‍යාත පදය
(අ)	ගමු	ලබයි	
(ආ)	ගහ	පිළිගනියි	
(ඉ)	ජහ	අත්හරියි	
(ඊ)	නී	ගෙන එයි	
(උ)	පද	උපදියි	
(ඌ)	වද	අවවාද කරයි	
(එ)	විස	පිවිසෙයි	
(ඒ)	චර	සැරිසරයි	
(ඔ)	සහ	උත්සාහ කරයි	
(ම)	හර	බැහැර කරයි	

(ලකුණු 5+5+5+5=20)

ආදර්ශ පිළිතුරු

(i)

	ශබ්ද ප්‍රකෘතිය	දුතියා බහුවචන	චතුත්ථී එකවචන
(අ)	භික්ඛු	භික්ඛූ, භික්ඛවො	භික්ඛුනො, භික්ඛුස්ස
(ආ)	රත්ති	රත්ති, රත්තියො	රත්තියා
(ඉ)	ඵල	ඵලෙ, ඵලානි	ඵලාය, ඵලස්ස
(ඊ)	අම්හ	අම්හාකං අම්හෙ	මම, මය්හං, මමං
(උ)	දසම	දසමෙ	දසමාය, දසමස්ස

(ii)

(අ) සු + ත්වාන
(ආ) කර +තුං
(ඉ) රඤ්ජ +තබ්බ
(ඊ) යා +ත
(උ) භුඤ්ජ +අන්ත
(ඌ) වද +ත්වා
(එ) ප්ලව + මාන
(ඒ) පුච්ඡ +ත
(ඔ) ඉසු + එය්‍ය
(ම) හර +ස්සං

(iii)

(අ) ආලස්‍යං
(ආ) කුලවා
(ඉ) ධම්මිකො
(ඊ) දාලිද්දියං
(උ) නාගරො/නාගරිකො
(ඌ) නියාමිකං
(එ) පච්ඡිමො
(ඒ) මනුස්සත්තං
(ඔ) ඡට්ඨො
(ඕ) චතුත්ථො

(iv)

	ධාතුව	අර්ථය	ආඛ්‍යාත පදය
(අ)	ගමු	ලබයි	අධිගච්ඡති
(ආ)	ගහ	පිළිගනියි	පටිග්ගණ්හාති/පතිගණ්හාති
(ඉ)	ජහ	අත්හරියි	විජහති
(ඊ)	නී	ගෙන එයි	ආනයති
(උ)	පද	උපදියි	උපපජ්ජති
(ඌ)	වද	අවවාද කරයි	ඔවදති
(එ)	විස	පිවිසෙයි	පවිසති
(ඒ)	චර	සැරි සරයි	සඤ්චරති
(ඔ)	සහ	උත්සහ කරයි	උස්සහති
(ඕ)	හර	බැහැර කරයි	නීහරති

ලකුණු දීමේ ක්‍රමය

මෙම ප්‍රශ්නයේ සෑම කොටසකට ම **ලකුණු 05** බැගින් හිමි වේ. (i) (ii), (iii) (iv) කොටස්වල එක් නිවැරදි පිළිතුරකට **ලකුණු භාගය** බැගින් හිමි වේ.

(ලකුණු 5 + 5 + 5 + 5= 20)

7. (i) පහත දැක්වෙන ගථාද්වය සම්පූර්ණ කොට ලියා දක්වන්න.

(අ) නිධීනං'ව පවත්තාරං .....

(ආ) මාතාපිතා දිසා පුබ්බා .....

(ii) පහත දැක්වෙන අරුත් පැවසෙන පාලි වචන නිර්දිෂ්ට ග්‍රන්ථාගත පරිදි ලියා දක්වන්න.

(අ)	අල්ලස	(උ)	පඩික්කම
(ආ)	උදැල්ල	(ඔ)	පඬුරු
(ඉ)	කම්මුල	(ඒ)	පාවහන්
(ඊ)	තුඹස	(ඕ)	මකුළු දැල
(උ)	නොදුටු මිත්‍රයා	(ඖ)	මැටි

(iii) පහත ගාථා පාදවලින් කියැවෙන අදහසෙහි ධර්මානුකූල වැදගත්කම අනාවරණය කරන්න.

දාන්යේව පෙය්‍යවජ්ජාස්මේව - අත්ථචරියා ච යා ඉධ,
සමානත්තතා ච ධම්මෙසු - තත්ථ තත්ථ යථාරහං,
එතෙ ච සඞ්ගහා ලොකෙ - රථස්සාණී'ව යායතො.

(iv) 'කුශලය යටපත් වී අකුශලය ඉස්මතු වූ කල්හි ව්‍යසන හා උපද්‍රව ඇති වේ.' මහාසුපින ජාතකයෙන් අනාවරණය කෙරෙන මෙම අදහස වර්තමාන සමාජ තත්ත්වය ඇසුරෙන් විචරණය කරන්න.

(ලකුණු 5+5+5+5 =20)

ආදර්ශ පිළිතුරු

(i)

(අ) නිධීනංව පවත්තාරං, යං පස්සෙ වජ්ජදස්සිනං,
නිග්ගය්හවාදිං මෙධාවිං, තාදිසං පණ්ඩිතං භජෙ,
තාදිසං භජමානස්ස, සෙය්‍යා හොති න පාපියො.

(ආ) මාතාපිතා දිසා පුබ්බා, ආචරියා දක්ඛිණා දිසා,
පුත්තාරා දිසා පච්ඡා, මිත්තාමච්චා ච උත්තරා.

(ii)

(අ) ලඤ්ඡං
(ආ) කුද්දාලං
(ඉ) කණ්ණමූලං
(ඊ) වම්මිකො
(උ) අදිට්ඨසහායො
(ඌ) බෙලමල්ලකො
(එ) පණ්ණාකාරෙ
(ඒ) උපාහන /පාදුක
(ඔ) සන්තානකං
(ඕ) මත්තිකා

Past Papers Wiki - Download More Past Papers and Study Well!

(iii)

- දානය ප්‍රියවචනය අර්ථචර්යාව හා සමානාත්මතාව යන මේ සතර සංග්‍රහ වස්තුව සමාජයේ යහපැවැත්මට ඉවහල් වන බව
- අඹු දරු සබඳතාව, මිතුරු සබඳතාව, සේව්‍ය සේවක සබඳතාව පවතින්නේත් මේ සතර සංග්‍රහ වස්තුව පදනම් කරගෙන බව
- රජු හා රටවැසියා අතර සබඳතාවේ මූලික පදනම සතර සංග්‍රහ වස්තුව බව
- රථයේ කඩ ඇණය නිසා රථයේ ගමන පවත්න්නාක් මෙන් සතර සංග්‍රහ වස්තුවේ පැවැත්ම නිසා සමාජයේ ඉදිරි ගමන පවතින බව
- රථයේ කඩ ඇණය කුඩා වුවත් එය බිඳ වැටීමෙන් රථය ඉදිරියට නොයන්නාක් මෙන් සතර සංග්‍රහ වස්තුවෙන් තොරව සමාජ ප්‍රගමනය සිදු නොවන බව

(iv)

- කලට වැසි නොලැබීම
- ශස්‍ය මැලවී යාම
- දුර්භික්ෂය ඇතිවීම
- ස්වාභාවික පරිසරයේ ඇතිවන වෙනස්කම් නිසා මිනිසුන් මුළාවට පත්වීම
- කුඩා ගැහැණු දරුවන් ගැබ් ගැනීම
- මව්පියන්ට වැඩිහිටියන්ට නොසැලකීම
- පවුලේ ධනය වැඩි හිටියන්ට නොදී දරුවන් පරිහරණය කිරීම
- සුදුස්සාට රාජකාරී නොපවරා පක්ෂපාතී නොසුදුස්සන් පත්කිරීම නිසා රාජ්‍යය අංශය බිඳ වැටීම
- නීතිය පසිදලන්නත් අල්ලස් ගෙන කටයුතු කිරීම
- උගත් කුලවත්තු නොසුදුස්සන්ට සේවාකම් කිරීම පමණක් නොව තම ධනය අඹුදරුවන්ට පවරා දී බියෙන් කල් ගෙවීම
- පවුලේ ස්ත්‍රීන් දුසිරිතයට යාම නිසා පවුල් ඒකකය බිඳ වැටීම
- ධනවතුන් තව තවත් ධනය ගොඩ ගසා ගැනීම නිසා දුප්පත්කම වැඩිවීම
- මහණ බමුණන් මුදලට බණ කීමට පෙළඹීම ආදී කරුණු වර්මාන සමාජය ඇසුරෙන් විවරණය කර තිබිය යුතුය.

ලකුණු දීමේ ක්‍රමය

මෙම ප්‍රශ්නයේ සෑම කොටසකට ම **ලකුණු 05** බැගින් හිමි වේ. (i) කොටසේ එක් ගාථාවක් නිවැරදිව ලිවීමට **ලකුණු දෙක හමාර** බැගින් බෙදා ගන්න. (ii) කොටසේ එක් නිවැරදි පිළිතුරකට **ලකුණු භාගය** බැගින් හිමි වේ. (iii), (iv) කොටස් සඳහා ආදර්ශ පිළිතුරෙහි දී ඇති කරුණු ආශ්‍රයෙන් ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 05 පිරිනමන්න.

(ලකුණු 5 + 5 + 5 + 5= 20)

PAST PAPERS WIKI

WWW.PastPapers.WIKI

Past Papers Wiki - Download More Past Papers and Study Well!